## 1 : 1 හැඳින්වීම

"ළමා සිත් සතන් තුළ ඇති වන ස්වභාවික ලැදියාවන් යහපත් ක්‍රියා සිදහා විධිමත්ව ක්‍රමවත්ව පුරුදු පුහුණු කිරීම අධ්‍යාපනයයි.එම ක්‍රියාවලිය ඇරඹිය යුත්තේ සංගීතයෙනි." (සොයිසා, 2006)

සංගීතය යනු මිනිස් ආත්මයම පෝෂණය කරන්නා වූ සෞන්දර්ය අංගයන්ගෙන් සුවිශේෂ වූ කලා මාධ්‍යයක් වෙයි. මිනිස් සන්තානයේ අතිශය සියුම් ස්ථාන විනිවිද යාමේ ප්‍රබල වූ සන්නිවේදන ගුණයක් ඊගත් සංගීතය විශ්ව භාෂාවක් ලෙස හඳුන්වයි. ප්‍රාසාංගික කලාවේ උත්තම ස්ථානයක වැජඹෙන සංගීතය මිනිස් හදවත පෝෂණය කරන්නා වූ උසස් මානසික ලක්‍ෂණ ප්‍රගුණ කරවන්නා වූ ශාරීරික හා මානසික සෞඛ්‍යයට හිතකර වූ සංවේදී විෂයක් ලෙස හැඳින්විය හැකිය.

අධ්‍යාපන මනෝ විද්‍යාව අනුව සමබර පුද්ගලයෙකු බිහි කිරීම උදෙසා ප්‍රජානන, ආවේදන හා මනෝ චාලක යන ක්ෂේත්‍ර තුනම සංවර්ධනය කළ යුතුය. මෙම ආවේදන ක්ෂේත්‍රයේ සංවර්ධන සඳහා ප්‍රධාන වශයෙන් සෞන්දර්ය අධ්‍යාපනයට හිමිවනුයේ අද්විතීය ස්ථානයකි. රසවින්දනය හෙවත් රසඥතාව වර්ධනය නිර්මාණාත්මක චින්තනයේ වර්ධනය හා නිර්මාණාත්මක කුසලතා වර්ධනය යන ක්ෂේත්‍රයන් හි පූර්ණ සංවර්ධනයක් ආවේදන ක්ෂේත්‍රය සංවර්ධනය මඟින් අපේක්ෂිතය. ඒත් නූතනයේ ආවේදන හා මනෝ චාලක ක්ෂේත්‍ර අභිබවා ප්‍රජානන ක්ෂේත්‍රය ඉදිරියට ගමන් කරයි එමඟින් දැනුම හා විභාග අපේක්ෂාව විනා ගැඹුරු ආධ්‍යාත්මික සෞන්දර්ය කතිකාවක් ඇති වීම වලකාලයි. වර්තමාන ශ්‍රී ලාංකේය අධ්‍යාපනය මෙකී ව්‍යසනයට ගොදුරු වී අවසන්ය.

වර්තමාන පාසල් අධ්‍යාපනය තරගකාරී විභාග ක්‍රමය ඔස්සේ පාඩම් කිරීමේ ක්‍රියාවලියක් බවට පත්ව ඇත. ජීවිතය, සමාජය, ලෝකය දෙස පුළුල් අවබෝධයකින් තොරව ජීවිතයේ අභියෝග සඳහා සාර්ථකව මුහුණ දීමට ශක්තිය නොමැති කායික හා මානසික පීඩනයකින් පසුවන ශිෂ්‍යයන්ට තරගකාරීතාවයෙන් මිදී ජීවිතය දෙස පුළුල්ව බැලීමට හැකි වන ලෙස අධ්‍යාපන ක්‍රමය සකස් විය යුතුය.

ළමයෙකුගේ කායික, මානසික හා පෞරුෂය යන අංශ වර්ධන වීමේ දී එය වඩා යහපත් ආකාරයට සිදු වීම සඳහා සංගීතය මඟින් සෘජු බලපෑමක් සිදු වේ. බිළිදෙකු ලෙසින් මව් කුසින් මෙළොව එළිය දක්නට පෙර ඔහු කළලයක් ලෙසින් සිටිය දී මවගේ හෘද ස්පන්දනයෙන්

වින්දනයත්, ඉන් අනතුරුව හැඬීම තුළින් ස්වරයත්, පසුව මවගේ තන පුඩුවෙන් කිරි උරා බීම තුළින් රසයත් මූලික ලෙස හඳුනා ගනු ලබයි.

රටක සංස්කෘතිය මුලිමනින්ම වාගේ පවතින්නේ ඒ රටෙහි පවතින කලාව මත බව බොහෝ ප්‍රභූවරුන්ගේ මතයයි. කිසියම් සමාජයක් යැයි හැගෙන්නේ ඒ සමාජයේ රුචිකත්වය අනුව බව තර්ක කළ හැකිය. මෙහිදී සමාජය උසස් කිරීමෙහිලා සංගීතය කොතරම් දායකත්වය සපයන්නේ දැයි බැලීම වටී. සංගීත සිද්ධාන්තයන්ගේ එන නීති රීති ඉගෙනීම හා පිළිපැදීම උසස් සංගීත කෘතින් නිර්මාණය කිරීම සඳහා හේතු වන්නක් මෙන්ම උසස් සංගීත රුචිකත්වයක් ඇතිකර ලීමට ද පොහොසත් වේ. එමෙන්ම සංගීතයෙහි උසස් පහත් භාවයන් මොනවට වටහා ගත හැක්කේ සංගීතය කල්පනාකාරීව ඉගෙනීම තුළින්ය.

වර්තමානයේ පාසල් සංගීත විෂය නිර්දේශය තුළ රසඥතාවය වර්ධනය කිරීම සහ නිර්මාණාත්මක චින්තනය හා කුසලතාව වර්ධනය කිරීම ප්‍රධාන අරමුණක් ලෙස ඉදිරිපත් කර ඇත. මෙකී අරමුණු වර්තමාන පාසල් සංගීත අධ්‍යාපනය තුළින් කොතෙකුත් දුරට ඉටුවන්නේ ද යන්න ගැටලුවක් වී පවතී. මන්ද යත් වර්තමානයේ බිහිවන්නා වූ නිර්මාණයන්ගෙන් නිර්මාණාත්මකභාවය මෙන්ම රසඥතාවයේ පිරිහීමත් ප්‍රබල සමාජ ගැටලුවක් ලෙස හඳුනාගත හැකිය.

වින්දනයෙන් තොර වූ නිර්මාණයක්ද නිර්මාණයෙන් තොර වූ වින්දනයක් ද පැවතිය නොහැකිය. එසේ හෙයින් උසස් රසවින්දනයක් ඇති කිරීම සඳහා උසස් නිර්මාණ රස විදිය යුතු අතර නිර්මාණ කෞශල්‍යය සංවර්ධනය කර ගැනීම උදෙසා රසඥතාවය වර්ධනය කර ගත යුතුය.

වර්තමාන සංගීත නිර්මාණකරණය පිළිබඳ අවධානය යොමු කළ විට එහි පවත්නා පහත් නිර්මාණාත්මකභාවය කැපී පෙනෙන්නා වූ ලක්ෂණයකි. එමෙන්ම වර්තමානයේ සංගීත නිර්මාණ යනු හුදෙක් ගීතයකට පමණක් සීමා වූවක් බවට පත්ව ඇත. ශ්‍රී ලාංකේය සංගීත නිර්මාණකරණය තුළ සම්භාව්‍ය වූත් නිර්මාණාත්මක වූත් සංගීත කෘති විරලය. මේ නිසා වර්තමාන සංගීත රසඥතාවය අරුත් සුන් වදන්වලින් රචිත අනවශ්‍ය තාක්‍ෂණික භාවිතාවන්ගෙන් පෝෂිත ගීතයට පමණක් සීමා වී ඇත. විශිෂ්ට ගී තනුවක් හෝ සංධ්වනියක් රසවින්දනය තුළින් ලැබෙන්නා වූ කායික, මානසික සුවය අතිවිශාලය. නමුත් වර්තමානයේ මෙසා විශාල වැදගත්කමක් දරන සංගීත නිර්මාණ බිහි නොවන තරම්ය. බහුල වතුයේ රසික ජනතාවට බලහත්කාරයෙන් අස්වසන්නා වූ 'නව රැල්ල' නමින් හඳුන්වන්නා වූ ගීත විශේෂයකි. එමෙන්ම වර්තමානයේ පාසල් දරුවන්ගේ ද ප්‍රධාන රසවින්දන මාධ්‍යය වී ඇත්තේ ද මෙකී ගීත විශේෂයයි.

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් නිර්දේශිත පාසල් විෂය නිර්දේශය තුළ සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැදි මානසික තත්වයන් ලඟාකර ගැනීම හා සංගීතයේ අත්හදා බැලීම් සිදු කිරීම යනුවෙන් නිපුණතා දෙකක් හඳුන්වා දී ඇත. මෙකී නිපුණතා නිසි ආකාරව වර්ධනය නොවීම තුළින් ඉහත සඳහන් වූ පහත් රසඥතාව හා පහත් නිර්මාණකරණය යන ගැටලු පැන නැගී ඇතැයි මා විශ්වාස කරමි.

පූර්වෝක්ත කරුණු සඳහා පාසල් සංගීත අධ්‍යාපනය කොතෙක් දුරට දායක වන්නේදැයි විමර්ශනය කාලෝචිත යැයි මා හඟිමි. මේ නිසා මෙම පර්යේෂණ නිබන්ධනය තුළින් නිර්මාණාත්මක චින්තනය හා සංගීත රසඥතාවය වර්ධනය කිරීම සඳහා පාසල් සංගීත අධ්‍යාපනය මඟින් ඉටු වන්නා වූ කාර්යයන් සහ එහි දී මතු වන්නා වූ ගැටලු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක යෙදී ඇත.

## 1 : 2 ගැටලුව

වර්තමානයේ පවතින පාසල් සංගීත අධ්‍යාපන ක්‍රමය මඟින් නිර්මාණාත්මක චින්තනයෙන් හා කුසලතාවයෙන් පිරි මනා සංගීත රසඥතාවයක් ඇති සිසු පරපුරක් බිහිවේද ?

## 1 : 3 උපන්‍යාසය

වර්තමාන ශිෂ්‍ය ප්‍රජාව තුළ නිර්මාණාත්මක චින්තනය සහ සංගීත රසඥතාව පහළ මට්ටමක පවතී.

## 1 : 4 අරමුණ

නිර්මාණාත්මක චින්තනයෙන් හා මනා සංගීත රසඥතාවයෙන් යුතු සිසු පරපුරක් බිහි කිරීම සඳහා පාසල් සංගීත අධ්‍යාපනයේ කාර්යභාරය පිළිබඳ අධ්‍යයනය කිරීම.

## 1 : 5 අභිමතාර්ථ

- ❖ වර්තමාන පාසල් විෂය නිර්දේශය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ❖ මෙම විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේදි මතුවන්නා වූ ගැටලු හඳුනා ගැනීම සහ පිළියම් සෙවීම.